සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 40 S I,II |
|---|---|---|

**පෙරදිග සංගීතය I** — කාලය පැය තුනයි

සැලකිය යුතුයි :-
- ✶ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✶ අංක 1 සිට 40 තෙක් දී ඇති ①, ②, ③, ④ උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.

(01) සරල මධුර රාගයක් මෙන්ම සර්ව කෝමළ රාගයකි.
1. බිලාවල් 2. යමන් 3. භූපාලී 4. භෛරවි

(02) නි රිස, නි රිගරිස සහ නි සගුරිස, නි සගුමගුරිස ලෙස ස්වර සංගති යෙදෙන රාග යුගලය පිළිවෙළින්,
1. බිලාවල්- යමන් 2. යමන් - භෛරවි 3. යමන් - බිලාවල් 4. භෛරවි - යමන්

(03) "සර්ගම් ගී" සඳහා යෙදෙන තවත් නාමයකි.
1. ස්වර අලංකාර 2. ස්වර පල්ටා 3. ස්වර මාලිකා 4. ස්වර සංගති

(04) ග සහ නි වාදි සංවාදි වන රාගයකි.
1. යමන් 2. බිලාවල් 3. කාෆි 4. භෛරවි

(05) යමන් සහ භූපාලි යන රාග දෙක සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය වන්නේ,
1. රාග දෙකෙහිම වාදි සංවාදි ස්වර සමානය. 2. රාග දෙකම කල්‍යාණ මේලයෙන් උපදී
3. රාග දෙකෙහිම දිවා කාලයෙහි ගැයීමට සුදුසු ය. 4. රාග දෙකෙහිම ස්වර ශුද්ධව යෙදේ.

(06) දිවා ප්‍රථම ප්‍රහරයෙහි ගැයෙන රාගයකි.
1. යමන් 2. කාෆි 3. බිලාවල් 4. භූපාලි

(07) "කළණ මේල නිජ පිරුණු නිස ගැයෙන" යන ලක්ෂණ ගීත පාදයෙහි,
1. රාග ලක්ෂණ දෙකක් ඇතුළත් ය 2. රාග ලක්ෂණ එකක් ඇතුළත් ය
3. රාග ලක්ෂණ හතරක් ඇතුළත් ය 4. රාග ලක්ෂණ තුනක් ඇතුළත් ය

(08) භෛරවි රාගයෙහි විවාදි ස්වර ලෙස යෙදෙනුයේ.
1. රි ග ම ධ නි 2. රි ග ම ධ නි 3. රි ග ම් ධ නි 4. රි ගු ම් ධ නි

(09) ගාන්ධාරය සහ ධෛවතය වාදි සංවාදි වන රාගය වන්නේ,
1. බිලාවල් 2. යමන් 3. භෛරවි 4. භූපාලි

(10) ධෛවතය ගන්ධාරය සහ ගාන්ධාරය ධෛවතය වාදි සංවාදි වන රාග යුගලය පිළිවෙළින්,
1. බිලාවල් - භෛරවි 2. කාෆි - බිලාවල් 3. බිලාවල් - භූපාලි 4. භූපාලි - භෛරවි

(11) වර්ජිත ස්වර සහ විවාදි ස්වර යෙදෙන රාග යුගලය පිළිවෙළින්,
1. භූපාලි - කාෆි 2. භූපාලි - යමන් 3. යමන් - බිලාවල් 4. බිලාවල් - යමන්

(12) රාගයක වාදි, සංවාදි, මේලය, ගාන සමය ආදි විස්තර ඇතුළත් ගීතය වන්නේ,
1. සරිගම් ගීය 2. මධ්‍යලය ගීය 3. රාගධාරී ගීය .4. ලක්ෂණ ගීය

(13) මගමරි, ගපධනිස්, ආදි වශයෙන් ස්වර සංගති යෙදෙන රාගය
1. යමන් 2. බිලාවල් 3. භූපාලි 4. භෛරවි

(14) | නිධ - ප| ම් ප ග ම් | ආදී වශයෙන් යෙදෙන සර්ගම් ගීතයෙහි මීළඟ විභාග දෙකට අයත් ස්වර වනුයේ,
1. ප - - - | ම් ග රි ස | 2. ප - - - | ධ නි ස් - | 3. ප - - - | ප ම් ග රි | 4. ප - - - | ග ම් ප ධ |

(15) යමන් රාගය ආශ්‍රිත සරල ගීතයකි.
1. නැති බැරි මොහොතක 2. පාරමිතා බල පූරිත පූජිත 3. ගුමු ගුමුව වදුලේ 4. මන්නාරම් පිටි වැල්ලේ

*** 16 - 20 තෙක් ප්‍රශ්නවලට පහත සඳහන් ප්‍රකාශ ඇසුරින් පිළිතුරු සපයන්න.**

A -මාත්‍රා 10 යි, විභාග 04 යි. B -මාත්‍රා 08 යි, විභාග 02 යි. C-මාත්‍රා 14යි, විභාග 04 යි.
D -මාත්‍රා 06 යි, විභාග 02 යි. E -මාත්‍රා 16 යි, විභාග 04 යි.

(16) ඉහත සඳහන් A,B,C.D සහ E යන තාල නම් කරනුයේ,
1. ජප්, දාදරා, දීප්චන්දි, කෙහෙර්වා, ත්‍රිතාල් ලෙස ය.
2. කෙහෙර්වා,ජප්, දාදරා, ත්‍රිතාල් ලෙස ය
3. ජප්, කෙහෙර්වා,දීප්චන්දි, දාදරා, ත්‍රිතාල් ලෙස ය.
4. දීප්චන්දි, දාදරා,ජප්, කෙහෙර්වා, ත්‍රිතාල් ලෙස ය.

(17) තාල සංඥා සමාන වන තාල තුනකි.
1. A,B, C 2. A,C, E 3. D,C, E 4. B,D, C

(18) බටහිර සංගීත (Time Signature) අනුව 3/4 සහ 4/4 ලෙස යොදා ගන්නා හින්දුස්ථානී තාල වන්නේ,
1. C සහ B ය. 2. Dසහ B ය. 3. D සහ A ය. 4. B සහ E ය.

(19) "ආදරයේ උල්පත වූ අම්මා" සහ "නිල් අහස් තලේ අගේ" යන ගීත දෙකට යොදා ගන්නා තාල දෙක වන්නේ,
1. A සහ D ය. 2. Cසහ A ය. 3. E සහ C ය. 4. B සහ D ය.

(20) A සහ C යන තාල දෙක බටහිර සංගීත (Time Signature) තාල ලෙස හඳුන්වනුයේ,
1. 7/8, 5/8 ලෙස ය 2. 5/8, 7/8 ලෙස ය 3. 6/8,7/8 ලෙස ය 4. 5/8, 6/8 ලෙස ය

(21) පිය ගුණ සඳහන් සරල ගීතයකි.
1. ආදරයේ උල්පත වූ අම්මා 2. මිහි මඬලේ අඳුරු කුසේ 3. අම්මා සඳකි මම ඒ 4. ගමට කලින් හිරු

(22) අම්මාවරුනේ අම්මාවරුනේ යන ගීතය ගායනා කරනුයේ,
1. විශාරද නන්දා මාලනී 2. දීපිකා ප්‍රියදර්ශනී පීරිස් 3. මාලනී බුලත්සිංහල 4. රුක්මනී දේවී

(23) ස්වර ප්‍රස්ථාරයන්හි සඳහන් 𝄋 මෙම සංකේතය මගින් අදහස් කරනුයේ.
1. පෙර විභාගයේ ඇති ස්වර ඛණ්ඩය නැවත වාදනය කල යුතු බවය.
2. ස්වර ඛණ්ඩය දෙවරක් වාදනය කළ යුතු බවය.
3. මෙම සංකේතය මුලින් යෙදු ස්ථානයට අදාළ ස්වර ඛණ්ඩය වෙත නැවත ගමන් කළ යුතු බවය.
4. විභාග දෙකක් හෝ කිහිපයක් ස්වර ඛණ්ඩ දෙවරක් වාදනය කළ යුතු බවය.

(24) "කායදා" යන අංගය වාදනය කරනු ලබන්නේ,
1. වයලීනයෙනි 2. තබ්ලාවෙනි 3. සර්පිනාවෙනි 4. ගිටාරයෙනි

(25) ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ වාදනය කිරීමෙන් අත්වන ප්‍රයෝජනයකි.
1. ඒකල වාදනයට හුරුවක් ඇතිවේ.
2. වෘත්තීමය වශයෙන් වැදගත් වේ.
3. වාදනය කරමින් ගැයීමේ හැකියාව වර්ධනය වේ.
4. අතැගිලි සඳහා ව්‍යායාමයක් ලැබේ.

(26) ග්‍රැමෆෝනය නිපදවන ලද්දේ,
1. තෝමස් අල්වා එඩිසන් විසිනි.
2. ඇලෙක්සැන්ඩර් ග්‍රහැම් බෙල් විසිනි.
3. මාර්කෝනි විසිනි.
4. විලියම් හෙන්ද්‍රි පේද්‍රිස් විසිනි.

(27) බටහිර ලෝකයේ නිර්මාණය වූ ග්‍රැමෆෝනය මෙරටට අවතීර්ණ වූයේ,
1. වර්ෂ 1925 දීය. 2. වර්ෂ 1903 දීය 3. වර්ෂ 1935 දීය 4. වර්ෂ 1912 දීය

(28) කපිරිඤ්ඤා ගීත සම්ප්‍රදාය ඇසුරු කරමින් සිංහල ගීත ගණනාවක් ගායනය කළ ගායකයෙකි.
1. සුනිල් ශාන්ත 2. ආනන්ද සමරකෝන් 3. මොහොමඩ් ගවුස් 4. ඇම්. ඇස්. ප්‍රනාන්දු

(29) ගුවන් විදුලි සරල ගීතයට මුල් අත්තිවාරම සැකසුවේ,
1. රුක්මනි දේවි සහ ජී. ආර්. එඩ්වඩ් විසිනි
2. ආනන්ද සමරකෝන් හා සුනිල් ශාන්ත විසිනි
3. සූර්ය ශංකර් මොල්ලිගොඩ සහ ආර් ඒ. චන්ද්‍රසේන විසිනි.
4. ඩබ්ලිව්. ඩී. අමරදේව හා එඩ්වින් සමරදිවාකර විසිනි.

(30) ආනන්ද සමරකෝන් ශූරීන් විසින් ගයන ලද සුවිශේෂී ගීතයකි.
1. එම්බා ගංගා නවතිනු
2. දියගොඩ සැම තැන
3. එන්ඩද මැණිකේ මමත් දියඹටා
4. පීනමුකෝ කළු ගඟේ.

(31) උපමා, උපමේය ආදි අර්ථාලංකාර, එළිසමය අනුප්‍රාසය ආදිය ඇතුළත් කාව්‍ය
1. ගැමි ගී වේ. 2. සමාජීය ගී වේ. 3. ප්‍රශස්ත ගී වේ. 4. සේ ගී වේ.

(32) අටවිසිමත් පැදියකට උදාහරණයකි.
1. මනමත් කරවන දන මුළු 2. පැහැසරණිය මිණි පැමිණිය.
3. රූ රැසේ අඳිනා ලෙසේ අත් 4. සඳවා සුදු වැලි පිවිතුරු

(33) "හෙළ ගී මඟ" නැමැති ජන සංගීත ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
1. ඩබ්ලිව්.බී.මකුලොලුව 2. සී. ද ඇස්. කුලතිලක 3. ලයනල් එදිරිසිංහ. 4. වින්සන්ට් සෝමපාල

(34) ලෝක ප්‍රසිද්ධ " සිතාර්" වාදකයෙකි.
1. ජග්ජිත් සිං 2. ශකීර් හුසෙන් 3. පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා 4. පණ්ඩිත් රවිශංකර්.

(35) පෙරදිග ශාස්ත්‍රීය සංගීතය ඉලෙක්ට්‍රෝනික සංගීතය සමඟ සංකලනයෙන් විශේෂයෙන් චිත්‍රපට සංගීත නිර්මාණය කළ සංගීතඥයා වන්නේ,
1. හරි ප්‍රසාද් චෞරසියා 2. ඒ.ආර්.රහමන් 3. ජග් ජිත් සිං 4. උස්තාද් සකීර් හුසෙන්

(36) රූප භේදය යනුවෙන් හඳුන්වන බටහිර සංගීතයෙහි Magnitude ලෙස හඳුන්වන විද්‍යාවේ නාදමය ගුණය හැඳින් වෙන්නේ,
1. විපුලතාවය යනුවෙනි. 2. තාරතාවය යනුවෙනි.
3. ධ්වනි ගුණය යනුවෙනි. 4. ජාතිභේදය යනුවෙනි.

(37) වයලීනය, සිතාරය සහ ගිටාරය ආදි වශයෙන් භාණ්ඩයන් වෙනස් වීම මත නාදයෙහි ඇති වන ගුණාංගය සංගීතයෙදී හඳුන්වන්නේ,
1. රූප භේදය 2. උච්චනීච භේදය 3. ජාති භේදය. 4. තාරතාවය

(38) උත්තර භාරතීය සංගීතය ඇසුරින් පණ්ඩිත් රවිශංකර් විසින් සංගීතවත් කළ චිත්‍රපටය වන්නේ,
1. බෛජු බව්රා - මධුමති 2. මදර් ඉන්ඩියා -පාතර්පංචාලි
3. කොහිනූර් - දෙව්දාස් 4. සංගම් - අභිමාන්

(39) සංගීත කොටස් හෝ විවිධ නාද ශබ්ද හෝ පරිඝණක තුළට ගෙන යන්නේ සහ පිටතට ඇසෙන ලෙස ගෙන එන්නේ,
1. Speaker මඟිනි. 2. Microphone මඟිනි. 3. Modem මඟිනි. 4. Sound Card මඟිනි.

(40) සංගීත නිර්මාණ කිරීම සඳහා වන මෘදුකාංගයකි.
1. Sound Forage 2. Cubase 3. Acid Pro 4.Adobe Audition

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 40 S I,II |
|---|---|---|

## පෙරදිග සංගීතය II

✶ පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) කෙටි පිළිතුරු සපයන්න.

I ____________රාගය ඖඩව ඖඩව ජාතියට අයත් රාගයකි.

II ____________රාගයෙහි අනුවාදි ස්වර ස රි ම ප නි ලෙස යෙදෙන අතර එය සම්පූර්ණ ජාති රාගයකි.

III ජන ගී වර්ගීකරණය අනුව දරුනැළවිලි ගීත අයත් වනුයේ ____________ගණයටය.

IV වර්ෂ 1870 දී මෙරට පැමිණි ____________ නම් පර්සියන් ජාතිකයාගේ පැමිණීමත් සමඟ නූර්ති නාට්‍ය ලංකාවේ ප්‍රචලිත විය.

V 1956 දී එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ___________නාට්‍ය වේදිකා ගතවීමත් සමඟ නව නාට්‍ය යුග ආරම්භ විය.

VI නාදයේ උස් පහත් බව හඳුන්වන්නේ ____________ නමිනි.

VII ගසල් රජු යන විරුදාවලිය ලත් ශ්‍රේෂ්ඨ සංගීතඥයා , විශිෂ්ඨ ගසල් ගායකයා වන්නේ ___________ය.

VIII ____________චිත්‍රපටයේ ගී තනු සුනිල් ශාන්තයන් විසින් නිර්මාණය කරන ලදී. ඕලු නෙලුම් නෙරිය රඟාලා ගීතය එහි එන ජනප්‍රිය ගීතයකි.

IX පැහැසරණිය මිණි පැමිණිය පැදිය .............. විරිතට අනුව ගැයේ එම ගී පාදයෙහි සඳැස්මත් ගණන වන්නේ _____________ කි.

X මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර ශූරීන් විසින් නිෂ්පාදිත __________ හා __________ නව නාට්‍ය සඳහා නාඩගම් නාට්‍ය ශෛලිය පාදක වී ඇත. (ල.1x12=12)

(02) පහත දී ඇති කරුණු ඇතුළත් කර වගුව සම්පූර්ණ කරන්න.

I ධ - ග , යමන් , ම - ස, ගපධනිස් , භෛරවි
ග - නි , කල්‍යාණ , බිලාවල් , මගු සරිස, ධු නි ස
නි රිග, රිස, පම'ගරිස , භෛරවි , බිලාවල්

| රාගය | ථාටය | වාදි- සංවාදි | මුඛ්‍යාංග |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

(ල. 1/2x12=6)

II රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයෙන සම්පූර්ණ රාගයක මධ්‍යලය ගීතයෙහි ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 04 යි)

III එම රාගයට අයත් කෙටි ස්වර ඛණ්ඩ 2ක් ලියන්න.. (ල. 02 යි)

(03) පහත දී ඇති උදාහරණ ජන ගී වර්ගීකරණයට අනුව බෙදා වෙන්කොට දක්වන්න.

I ඉන්ද්‍ර දිසාවට, වරමාති සුභ චරිතේ, සාරසදිසි, ඉපල් පිටින් ගහන, සඳවා සුදුවැලි පිවිතුරු, ගුණදූනේ, බෝසත්, රන් දෑ කැති ගෙන, යුද්දෙටත් ඇවිත් සිඳුපිට, බුද්ධං සරණේ, එළුවන් කන්නයි, තණ්ඩලේ දෙන්නා, නුඹේ අම්මා කිරට ගියා (ල. 1/2 x 12 = 6 යි)

II අනාඝාතාත්මක ගැමි ගී යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල. 02 යි)

III ඔබ උගත් සේ ගීයක් ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 04 යි)

(04)I පහත සඳහන් අක්ෂර තබ්ලා දායං හා බායං වශයෙන් කොටස් දෙකට වෙන් කොට දක්වන්න.
ති, කත්, න, ක. තු, ගෙ (ල. 03 යි)

II ලක් දිවට බැස එදා යන පැදි පාදයට ගැලපෙන හින්දුස්තානි තාලය තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 03 යි)

III සමග්‍රහ, අවග්‍රහ හා විෂම ග්‍රහ සඳහා ගී පාද එක බැගින් උදාහරණ දක්වන්න. (ල. 06 යි)

(05)I ග්‍රැමෆෝන් ගී 2ක් සහ එම ගී ගයන ගායක ගායිකාවන් දෙදෙනකු නම් කරන්න.. (ල. 04 යි)

II ග්‍රැමෆෝන් ගී ප්‍රධාන වශයෙන් කොටස් 4 කට බෙදා දක්වන්න. (ල. 04 යි)

III ඔබ ස්වර පුවරුවෙන් වාදනය කළ මුල් යුගයේ සරල ගීතයක මුල් කොටස ස්වර ප්‍රස්තාර ගත කරන්න. (ල. 04 යි)

(06) /ධ ස -ස/සසනි ස/රිරිග - / මගරි-/
/ගමපග/මරිනි රි/ස---/----/

I ඉහත සඳහන් ස්වර ප්‍රස්තාරය බටහිර සංගීතයට අනුව ප්‍රස්තාර කරන්න. (ල. 04 යි)

II එහි පළමු ස්වර ප්‍රස්තාර පේළිය මධ්‍යම භාවයට පෙරලා ප්‍රස්තාර කරන්න. (ල. 04 යි)

III පහත සඳහන් සංකේත නම් කරන්න.

(අ)  (ආ)  (ඇ)  (ඈ)  (ල. 04 යි)

(07) පහත සඳහන් සංගීත වේදීන් අතරින් 4 දෙනෙකු පිළිබඳ කරුණු තුන බැගින් වනසේ කෙටි සටහන් ලියන්න.

1. රෝහණ බැද්දගේ
2. ඒ.ආර්. රහුමාන්
3. ඩබ්ලිව්.බී. මකුලොලුව
4. ජග්ජිත්සිං
5. සී. ද. එස්. කුලතිලක
6. හරිප්‍රසාද් චෞරසියා

(ල.3x4=12)